## 198 තිලොව සුරකිනා

තිලොව සුරකිනා පියදෙව් සමිඳේ
අසරණ මගේ පිළිසරණය ඔබයි සමිඳුනේ
මගේ ජීවිතේ ජය මාවත ඔබ වේ
ඔබෙන් පිටත දිනුම් කණුව නැත හමුවන්නේ

අනේ සමිඳුනේ ඔබේ නිවහනේ
ඉන්න සැමදිනේ දෙන්න අවසරේ //

ජීවිත කතරේ සසර මඟ ගෙවා
යන විට මා යායුතු මඟ ඔබ පෙන්වනවා
යන මඟ නොපෙනී ඝන අඳුර වැටෙද්දී
මගේ අත ගෙන ඔබ මා නිසි මඟ ගෙනයනවා

මගෙ ජීවිතේ කඳුළු පිසදමා
මට සැනසුම ගෙන දෙන්නේ ඔබයි සමිඳේ
අඳුරු මගේ සිතේ ඝන අඳුර බිඳ දමා
ආලෝකය ගෙන දෙන හිරු ඔබමය සමිඳේ

සතුරන් හමුවේ ඔබ මා හැරදා
අසරණ නොකරන බව මම දනිමි සමිඳුනේ
එබැවින් ඔබගේ නිති සුව දෙන නිවසේ
වසනට අවසර දෙනු මැන ඒ ඇත මට පියේ